# පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
# மாகாண சமூக சேவைகள் திணைக்களம் - வடமத்திய மாகாணம்
# PROVINCIAL DEPARTMENT OF SOCIAL SERVICES – NORTH CENTRAL PROVINCE

372, ධර්මපාල මාවත, අනුරාධපුර. இல 372,தர்மபால மாவத்தை, அநுராதபுரம் NO. 372, Dharmapala Mawatha, Anuradhapura

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ<br>பணிப்பாளர்<br>Director | 025 - 2234673 | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 025 - 2224173 | ෆැක්ස්<br>பெக்ஸ<br>Fax | 025 - 2225316 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No. | NCP/SS/E1/ | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2016/08/ 22 |

පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව,
චක්‍ර ලේඛන අංක 01/2016/02.

උතුරු මැද පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
උතුරු මැද පළාතේ සමාජ සේවා නිළධාරීන් වෙත,

<u>වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්මයට භාජනය කරන පුද්ගලයින් සඳහා ආධාර මුදලක් ගෙවීම.</u>

උතුරු මැද පළාත තුළ ව්‍යාප්තව පවතින වකුගඩු ව්‍යසනය හේතුවෙන් පවුල් ඒකක වල ගෘහ මූලිකයා හෝ දරුවකු රෝගයට ලක් වීම මත එම පවුලට නිරන්තරයෙන් ප්‍රතිකාර කිරීමට සිදුවීමෙන් පවුලේ ඉපැයීම් ශක්තිය හීන වීම නිසාවෙන් සමස්ථ ආර්ථිකය බිඳවැටීමකට ලක් වේ.මේ හේතුවෙන් රෝගියාගේ ශරීර ශක්තිය හා පෝෂණ පිරිහීමත්, යැපෙන්නන් පෝෂණය කර ගැනීමට නොහැකි තත්වයට පත් වීමත් තුළ ඔවුන් කායික මෙන්ම මානසික දුබලතාවයකට පත්වේ.

මෙවන් තත්වයක් උද්ගත වී ඇති පවුල් ඒකක වල රෝගීන්ගේ වකුගඩු අක්‍රිය තත්වයකට පත් වීම හේතුවෙන් වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්මයට භාජනය කිරීමට සිදු වේ.ඒ සඳහා දායකයෙකු ද සොයා ගැනීමට ද රෝගියාට සිදුවන අතර, ඒ වෙනුවෙන් ඔවුන්ට විශාල කැපකිරීමක් කළ යුතු වේ.

මෙම රෝගියාට නිරන්තරයෙන් රෝහලෙන් ප්‍රතිකාර ගැනීමට සිදුවන අතර, අවම වශයෙන් මාස 06 ක කාලයක් දූවිලි වලින් තොර හොඳ පරිසරයක නවාතැන් ගැනීම කළ යුතු වේ.මේ සඳහා රෝහල ආසන්නයේ නවාතැන් ගැනීම වඩාත් යෝග්‍ය වේ.මේ සඳහා අධික වියදමක් දැරීමට සිදුවන අතර, මේ හේතුවෙන් ඔවුන් මහත් ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ පා අසරණ තත්වයකට පත් වේ.මෙම රෝගීන්හට වකුගඩු ආරක්ෂණ පදනම යටතේ ලබා දෙනු ලබන රු. 25,000.00 ක මුදල ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමට ප්‍රමාණවත් නොවේ.

මේ වන විට රෝහලේ වකුගඩු බද්ධ කරන වෛද්‍යවරයාගේ නියමය පරිදි දැනට වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්මයට භාජනය වන රෝගීන්ට රුකුලක් වීම පිනිස නවාතැන් ගාස්තු, බස් ගාස්තු, ආහාරපාන වියදම් පියවා ගැනීම සඳහා එක් මාසයකට රු. 15,000.00 බැගින් මාස 06 ක කාලයක් සඳහා උක්ත ආධාර මුදල ලබා දීමට (2016/62 ) දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. එම අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ~~මෙත~~ මෙම චක්‍රලේඛනය නිකුත් කරනු ලැබේ.

එස්.එස්.එම්.සම්පත් රෝහණ ධර්මදාස,
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
උතුරු මැද පළාත.